" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்

OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை. பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 | SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2024.08.16

පාලන චක්‍රලේඛ අංක : 02 / 2024

ආණ්ඩුකාර ලේකම් (බ.ප),

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම් (බ.ප),

ලේකම් (පළාත් පාලන / අධ්‍යාපන / කෘෂිකර්ම / ප්‍රවාහන / සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / පිරිස් හා පුහුණු / මූල්‍ය / සැලසුම් / ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප),

ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප),

අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප),

ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම්,

<u>බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය - 2024</u>

බස්නාහිර පළාත් සභාව තුළ සේවයේ නියුතු සමස්ථ පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රීඩා කෞශල්‍යය ඔප්නැංවීම,සුහදතාවය, කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම සහ කාර්ය සාධනය ඉහළ නැංවීම තුළින් සේවාලාභී සත්කාරය වැඩිදියුණු කිරීම උදෙසා බස්නාහිර පළාත් සභාවේ අන්තර් ආයතන මට්ටමින් ආණ්ඩුකාරවර කුසලානය - 2024 ක්‍රීඩා තරඟාවලිය මෙම වසරේදී ද පැවැත්වීමට නියමිතව ඇත.

02. මෙම "ආණ්ඩුකාරවර කුසලානය - 2024" ක්‍රීඩා තරඟාවලිය පහත සඳහන් ක්‍රීඩා ඉසව්වලින් සමන්විත වේ.

පවත්වනු ලබන ක්‍රීඩා

- ➢ සැහැල්ලු පන්දු ක්‍රිකට් - කාන්තා / පිරිමි
- ➢ වොලිබෝල් - කාන්තා / පිරිමි
- ➢ කඹ ඇදීම - කාන්තා / පිරිමි
- ➢ නෙට්බෝල් - කාන්තා
- ➢ එල්ලේ - කාන්තා / පිරිමි
- ➢ බැඩ්මින්ටන් - කාන්තා / පිරිමි
- ➢ කැරම් - කාන්තා / පිරිමි
- ➢ මලල ක්‍රීඩා - කාන්තා / පිරිමි

මලල ක්‍රීඩා ඉසව් පහත පරිදි වෙ

- හෙල්ල විසි කිරීම (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- හෙල්ල විසි කිරීම (40 න් පහළ) - කාන්තා / පිරිමි
- කව පෙත්ත විසි කිරීම (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- කව පෙත්ත විසි කිරීම (40 න් පහළ) - කාන්තා / පිරිමි
- යගුලිය දැමීම (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- යගුලිය දැමීම (40 න් පහළ) - කාන්තා / පිරිමි
- දුර පැනීම (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- දුර පැනීම (40 න් පහළ) - කාන්තා / පිරිමි
- උස පැනීම (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- උස පැනීම(40 න් පහළ) - කාන්තා / පිරිමි
- 100 m (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 100 m (40 න් පහළ) - කාන්තා / පිරිමි
- 200m (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 200m (40 න් පහළ) - කාන්තා / පිරිමි
- 400m (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 400m (40 න් පහළ) - කාන්තා / පිරිමි
- 100m x 4 (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 100m x 4 (40 න් පහළ) - කාන්තා / පිරිමි
- තරඟ ඇවිදීම (40න් පහළ) - කාන්තා/ පිරිමි
- තරඟ ඇවිදීම (40න් ඉහළ) - කාන්තා/පිරිමි

03. ඉහත තරඟ ඉසව් 15 ක් වෙනුවෙන් ශූරතා 15ක් , අනුශූරතා 15 ක් හා තෙවන ස්ථාන ශූරතා 15 ක් පිරිනැමීමට අපේක්ෂිත අතර පහත පරිදි ඉසව් සඳහා ක්‍රීඩක /ක්‍රීඩිකාවන් සම්බන්ධ කළ යුතු වේ.

| අනු අංකය | පවත්වනු ලබන ක්‍රීඩාව | කාන්තා/ පිරිමි | සහභාගි විය හැකි ක්‍රීඩකයින් සංඛ්‍යාව | අතිරික්ත ක්‍රීඩකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ක්‍රිකට් | කාන්තා / පිරිමි | 11 | 3 |
| 2 | වොලිබෝල් | කාන්තා / පිරිමි | 6 | 8 |
| 3 | කඹ ඇදීම | කාන්තා / පිරිමි | 8 | 2 |
| 4 | නෙට්බෝල් | කාන්තා | 7 | 5 |
| 5 | එල්ලේ | කාන්තා / පිරිමි | 16 | 4 |

| අනු අංකය | පවත්වනු ලබන ක්‍රීඩාව | කාන්තා/ පිරිමි | සහභාගි විය හැකි ක්‍රීඩකයින් සංඛ්‍යාව | අතිරික්ත ක්‍රීඩකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 6 | බැඩ්මින්ටන් | කාන්තා / පිරිමි | 5 | 2 |
| 7 | කැරම් | කාන්තා / පිරිමි | | |
| 8 | හෙල්ල විසි කිරීම(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | එක් ඉසව්වක් සඳහා ආයතනයකින් 3 දෙනෙකි. (සහය තරඟ හැර) | |
| 9 | හෙල්ල විසි කිරීම(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 10 | කව පෙත්ත විසි කිරීම(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 11 | කව පෙත්ත විසි කිරීම(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 12 | යගුලිය දැමීම(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 13 | යගුලිය දැමීම(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 14 | දුර පැනීම(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 15 | දුර පැනීම(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 16 | උස පැනීම(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 17 | උස පැනීම(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 18 | 100 m(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 19 | 100 m(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 20 | 200m(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 21 | 200m(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 22 | 400m(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |
| 23 | 400m(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 24 | 100mx 4(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | එක් ආයතනයකින් සහය කණ්ඩායම01 (පිරිමි/කාන්තා) *එක් කණ්ඩායමකට 04* | 02 |
| 25 | 100m x 4(40 න් පහළ) | කාන්තා / පිරිමි | | |
| 26 | 200m x 4(40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | |

| අනු අංකය | පවත්වනු ලබන ක්‍රීඩාව | කාන්තා/ පිරිමි | සහභාගී විය හැකි ක්‍රීඩකයින් සංඛ්‍යාව | අතිරික්ත ක්‍රීඩකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 27 | තරඟ ඇවිදීම (40න් ඉහළ) | කාන්තා / පිරිමි | එක් ආයතනයකින් 05 (පිරිමි/කාන්තා) | |
| 28 | තරඟ ඇවිදීම (40න් පහළ) | කාන්තා / පිරිමි | | |

04. ජයග්‍රාහිකයන්ට පළාත් වර්ණ පිරිනැමීම තෝරා ගත් දිනකදී පළාත් වර්ණ රාත්‍රියේදී සිදු කෙරෙනු ඇත.

05. අදාළ ඉසව් සඳහා බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් සහභාගී විය හැකි ආයතනගත කණ්ඩායම් පහත පරිදි වේ.

01) ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
02) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
03) සභා ලේකම් කාර්යාලය
04) අධ්‍යාපන අමාත්‍යංශය
05) සෞඛ්‍ය අමාත්‍යංශය
06) පළාත් පාලන අමාත්‍යංශය
07) මාර්ග අමාත්‍යංශය
08) කෘෂිකර්ම අමාත්‍යංශය
09) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය
10) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය
11) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය
12) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය
13) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලය

මෙම ආයතන අනිවාර්යයෙන්ම මේ සඳහා කණ්ඩායම් සහභාගී කළ යුතු වේ. මෙම ආයතන යටතේ පවතින විවිධ දෙපාර්තමේන්තු, අධිකාරී, ප්‍රාදේශීය කාර්යාල හා වෙනත් ආයතන මේ තරඟාවලිය සඳහා සහභාගී වීමට කැමැත්තේ නම් ඔවුන්ට සිය ආයතනය නියේජනය කරමින් කණ්ඩායම් සහභාගී කරවිය හැක. එහිදී කණ්ඩායම් ඉදිරිපත් කිරීම පහත පරිදි සීමා විය යුතුය.

- අධ්‍යාපන අමාත්‍යංශයට සිය අමාත්‍යංශ කණ්ඩායමට අමතරව පහත ආයතන නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී කරවිය හැක.
    - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
    - බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය
    - තොරතුරු සම්පත් සංවර්ධන අධිකාරිය
    - කලාප අධ්‍යාපන කාර්යාල (11)
    - කොට්ඨාස අධ්‍යාපන කාර්යාල (38)

- පළාත් පාලන අමාත්‍යංශයට සිය අමාත්‍යංශ කණ්ඩායමට අමතරව පහත ආයතන නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී කරවිය හැක.
    - පළාත් පාලන දෙපාර්තමේන්තුව
    - සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය (03)
    - මහ නගර සභා (07)
    - නගර සභා
    - ප්‍රාදේශීය සභා
    - ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය
    - වෙස්ප්‍රෝ මුද්‍රණාලය
    - වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය
    - සංචාරක මණ්ඩලය
    - අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය

- සෞඛ්‍ය අමාත්‍යංශයට සිය අමාත්‍යංශ කණ්ඩායමට අමතරව පහත ආයතන නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී කරවිය හැක.
    - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
    - සමාජ සේවා දෙපාර්තමේන්තුව
    - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව
    - ආයුර්වේද දෙපාර්තමේන්තුව
    - ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාල (3)
    - සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල
    - පළාත් රෝහල්
    - ප්‍රාථමික වෛද්‍ය ඒකක
    - පළාත් ආයුර්වේද රෝහල්
    - රජයේ වැඩිහිටි නිවාසය
    - ළමා / නිවර්තන නිවාස
    - සියළුම පුනරුත්ථාපන රැඳවුම් මධ්‍යස්ථාන

- මාර්ග අමාත්‍යාංශයට සිය අමාත්‍යාංශ කණ්ඩායමට අමතරව පහත ආයතන නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී කරවිය හැක.
    - කර්මාන්ත දෙපාර්තමේන්තුව
    - මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව
    - සමුපකාර දෙපාර්තමේන්තුව
    - සමුපකාර කොමිෂන් සභාව
    - නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව
    - ව්‍යාපාර නාම රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව
    - ග්‍රාම සංවර්ධන දෙපාර්පාර්මේන්තුව
    - කර්මාන්ත සංවර්ධන අධිකාරිය
    - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
    - මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
    - සියළුම කර්මාන්ත මධ්‍යස්ථාන

- කෘෂිකර්ම අමාත්‍යාංශයට සිය අමාත්‍යාංශ කණ්ඩායමට අමතරව පහත ආයතන නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී කරවිය හැක.
    - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
    - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
    - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
    - කෘෂි සේවා අධිකාරිය
    - සියළු නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම කාර්යාලය (03)
    - සියළු ගොවිපලවල්
    - සියළු කෘෂි නිෂ්පාදන අලෙවි ආයතන
    - සියළු කෘෂිකර්ම අලෙවි ආයතන

- ආදායම් දෙපාර්තමේන්තුව වෙනම කණ්ඩායමක් ලෙසත්, ඔවුන්ගේ ප්‍රාදේශීය කාර්යාල වෙනම කණ්ඩායම් ලෙසත් ඉදිරිපත් විය හැක.

- සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙනම කණ්ඩායම් ලෙස ඉදිරිපත් විය හැකිය.

- අභ්‍යන්තර විගණන ඒකකයටද වෙනම කණ්ඩායම් ලෙස ඉදිරිපත් විය හැකිය.

මේ ආකාරයට ඉදිරිපත් විය නොහැකි නම් ප්‍රධාන කණ්ඩායම හා ඒකාබද්ධව තරඟ වැදිය හැකි අතර එය අනිවාර්යයෙන් ඒ ඒ නිලධාරියා හෝ රාජකාරියට අදාල අමාත්‍යාංශය හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය හෝ දෙපාර්තමේන්තුව හෝ අධිකාරිය හෝ ප්‍රාදේශීය කාර්යාල හෝ කළාප හෝ කොට්ඨාශ විය යුතුය.

06. බස්නාහිර පළාත් සභාවේ කාර්ය මණ්ඩල සේවා තෘප්තිය උදෙසා පැවැත්වෙන්නක් බැවින් එකී තෘප්තිමත්භාවය වැඩි දියුණු කිරීම උදෙසා උක්ත ඉසව් නියෝජනය කරමින් ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ තරඟ වැදුණු හා/හෝ ජාතික සංචිත නියෝජනය කළ/කරන බස්නාහිර පළාත් සභාවේ සේවයේ නියුතු කිසිදු නිලධාරියෙකු හෝ නිලධාරිනියක මෙම තරග සඳහා සහභාගීවීම අවහිර කරනු ලැබේ.ජාතික මට්ටම ලෙස ජාතික ක්‍රීඩා, යොවුන් ක්‍රීඩා, ජාතික පාසල් (සමස්ත ලංකා) පාසල් ක්‍රීඩා යන සියළුම අදියරයන් අයිතිවන අතර එවන් තරඟ ඉසව් නියෝජනය කළ අයකු සිය කණ්ඩායමට ඇතුලත් නොකර සිටීමේ සමස්ථ වගකීම ඒ ඒ ආයතන ප්‍රධානීන්ට පැවරේ. යම් හෙයකින් එවන් අයෙකු මෙම ආණ්ඩුකාරවර කුසලානය 2024 තරඟාවලියේ ඉසව් සඳහා තරඟ වැදි බව කවර මොහොතක හෝ තහවුරු වුවහොත් අදාල කණ්ඩායම තරඟාවලියෙන් ඉවත් කරන අතර එම කණ්ඩායමට සහභාගීවීමට නියමිත හා/හෝ පැවැත්වූ තරඟ සියල්ල ඉවත් කිරීමට/තරඟ ප්‍රතිඵල අහෝසි කිරීමට කටයුතු කරනු ලැබේ.

- උක්ත සඳහන් කළ ආකාරයට හැර ඒ ඒ නිලධාරී කාර්ය මණ්ඩල තමන්ට හිමි කණ්ඩායම හැර වෙනත් කිසිදු කණ්ඩායමකට ක්‍රීඩා කළ නොහැකි අතර,එලෙස වංචා සහගත හෝ වැරදි නියෝජනයක් සිදුවන බව ලියාපදිංචි කරන අවස්ථාවේ හෝ ක්‍රීඩා කරන අවස්ථාවේ හෝ කවර මොහොතක සනාථ වුවහොත් අදාල කණ්ඩායම තරඟාවලියෙන් ඉවත් කෙරෙන අතර, එම කණ්ඩායමට සහභාගී වීමට නියමිත හා/හෝ පැවැත් වූ තරඟ සියල්ලක්ම ඉවත් කිරීමට හා තරඟ ප්‍රතිඵල අහෝසි කිරීමට කටයුතු කරනු ලැබේ.

- කණ්ඩායම් තරඟ සඳහා එක් ආයතනයකින් උපරිම වශයෙන් කණ්ඩායම් දෙකකට පමණක් ඉදිරිපත් විය හැකි අතර, එසේ ඉදිරිපත් වන අවස්ථාවකදී A කණ්ඩායම, B කණ්ඩායම ලෙස නම් කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එක් කණ්ඩායමක් තරඟාවලිය අතරතුර ඉවත් වුවහොත් එහි සිටි ක්‍රීඩකයන් යොදවා අනෙක් කණ්ඩායමට ක්‍රීඩා කළ නොහැකි අතර, එය ක්‍රීඩා වංචාවක් ලෙස සලකා පියවර ගනු ලැබේ.

- කේවල ඉසව් සඳහා ආයතනයකින් උපරිම වශයෙන් 05 දෙනෙකුට යටත්ව නම් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇතත්, අයදුම්පත්‍ර සලකා බැලීමේ කමිටුවේදී ලැබී ඇති අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව ආයතනයකට කේවල ඉසව් සඳහා උපරිම වශයෙන් සහභාගි කරවිය හැකි ක්‍රීඩක සංඛ්‍යාව තීරණය කරනු ඇත.

- ජවන හා පිටිය තරඟ සඳහා තරඟ දින උදෑසන සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවකගේම වෛද්‍ය වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

- සෑම තරඟයකදීම තරඟකරුවන් තරඟ අවස්ථාවේදී මත්ද්‍රව්‍ය හෝ තහනම් උත්තේජක හෝ භාවිතයෙන් තොරව තරඟ කිරීම අනිවාර්ය වේ.

- අදාල සංවිධායක ආයතන විසින් ඒ ඒ ඉසව්ව සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතු අතර එම ඇස්තමේන්තු සඳහා මෙහෙයුම් කමිටුව මගින් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

- එක් දිනක් තුළ තරඟ ඉසව් කිහිපයක්ම ක්‍රියාත්මක වීමට ඉඩ ඇති බැවින් ඒ ඒ ආයතනයේ බහුතර පිරිසකට නියෝජනය ලැබිය හැකි වන සේ කණ්ඩායම් සැකසීමට වගබලාගත යුතුය.

07. ඒ ඒ තරඟ ඉසව් සංවිධානය කරනු ලබන ආයතන විසින් තරඟ ඉසව්ව පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සම්පාදනය කර දිය යුතුය. තරඟ සංවිධායක කමිටුව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| එස්.ඩී. තෙවරප්පෙරුම මහතා | - | අධ්‍යක්ෂ (ක්‍රීඩා) |
| සසංක මෙන්ඩිස් මහතා | - | ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම් |
| සෙව්වන්දි හෙට්ටිආරච්චි මහත්මිය | - | පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ (බ.ප.) |
| ජගත් අඹකුඹුර මහතා | - | අධ්‍යක්ෂ,<br>තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය |
| සාරංගි ජයසුන්දර මහත්මිය | - | පළාත් පාලන කොමසාරිස් (බ.ප.) |
| අනිල් ප්‍රියදර්ශන මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්),<br>මාර්ග අමාත්‍යාංශය (බ.ප.) |

08. සිය ආයතනය නියෝජනය කරමින් ඒ ඒ ඉසව් සඳහා සහභාගි වන කණ්ඩායම් සඳහා ප්‍රවාහන පහසුකම්, සංග්‍රහ කටයුතු හා අනෙකුත් අවශේෂ සුහසාධක පහසුකම් ඒ ඒ ආයතනය විසින් දැරිය යුතු අතර, ඉසව්ව සංවිධානය කරන ආයතනය ඒ සඳහා කිසිදු පිරිවැයක් නොදැරිය යුතුය.

09. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2024 අගෝස්තු මස 31 දිනට හෝ ඊට පෙර සභාපති, ප්‍රධාන මෙහෙයුම් කමිටුව,නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන), ප්‍රධාන ලේකම් කාර්යාලය, 4 වෙනි මහළ, බස්නාහිර පළාත් සභා සංකීර්ණය, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඒ ඒ අයදුම්පත්‍ර පිළිබඳ සලකා බැලීම, ඔවුන් තරඟ සඳහා ඇතුළත් කිරීම, අභියාචනා වේ නම් ඒ පිළිබඳ සලකා බැලීම, තරඟ වංචා හා ලියාපදිංචි කිරීම් පිළිබඳ ගැටළු සලකා බැලීම හා තීරණ ලබා දීම, තරඟ පැවැත්වීම තරඟ සංවිධායක කමිටුව විසින් ඉටු කළ යුතු ය.

11. ඒ අනුව ඒ ඒ ඉසව්වට අදාළ අයදුම්පත්‍ර ලැබීමෙන් පසුව තීරක කමිටුව ඒ ඒ අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් සලකා බලා අනුමැතිය ලබාදීමෙන් අනතුරුව ඉදිරි දෙමසක කාලය තුළ තරග පවත්වා අවසන් කරනු ලැබේ. තරඟයකට අදාළව අභියාචනා වේ නම්, ක්‍රීඩකයා/ක්‍රීඩකයන් විසින් තම ආයතන ප්‍රධානියා මඟින් තම අභියාචනය ලිඛිතව මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

12. 2024 ඔක්තෝම්බර් මස 31 දිනට පෙර තරඟ පවත්වා අවසන් කිරීමට අපේක්ෂිත අතර, වර්ණ රාත්‍රිය 2024 නොවැම්බර් මස පැවැත්වීමට යෝජිතය.

13. ඉහත කරුණු වලට යටත්ව තරඟ අයදුම්පත්‍ර ඉදිරිපත් කර සිය ආයතනයේ නිලධාරීන් මෙම තරඟ වලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස සියලුම ආයතන ප්‍රධානීන්ට වගකීම පවරනු ලැබේ. එම තරඟ සඳහා සහභාගි වීමේදී හෝ තරඟ පුහුණුවීම් සඳහා සහභාගි වීමේදී හෝ මහජන සේවා සම්පාදනයට කිසිසේත් බාධාවක් නොවන බවට සියලුම ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

14. තරඟ සංවිධානය කරනු ලබන එක් එක් ආයතනයක් සඳහා සම්බන්ධීකරණ නිලධාරියකු පත් කොට ඒ පිළිබඳව **2024** අගෝස්තු **20** දිනට පෙර තරඟ සංවිධායක කමිටුවේ සභාපති, එස්.ඩී. තෙවරප්පෙරුම මහතා (පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ - අධ්‍යාපන අමාත්‍යාංශය, **2** මහළ, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල, බත්තරමුල්ල - දුරකථන අංක - **077 440 2813**) දැනුම්වත් කළ යුතුය.

15. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

**"බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය -2024" ක්‍රීඩා තරගාවලිය හා වර්ණ රාත්‍රිය සාර්ථක කර ගැනීමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමි.**

එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ ,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.


දුරකථන අංකය : 011-2092600
ෆැක්ස් අංකය : 011-2092601
විද්‍යුත් ලිපිනය : chiefsecretary@wpc.gov.lk


<u>පිටපත</u>

ආණ්ඩුකාර ලේකම්, බස්නාහිර පළාත - ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා

ආණ්ඩුකාරවර කුසලානය - 2024

තරග අයදුම් පත්‍රය

01. ආයතනයේ නම :

02. ඉදිරිපත් වන තරග ඉසව්ව :

03. ඉසව්ව සඳහා ඉදිරිපත් වන ක්‍රීඩක / ක්‍රීඩිකාවන්ගේ නම / නම :

| | නම | ජා.හැ.අ. | | නම | ජා.හැ.අ. |
|---|---|---|---|---|---|
| i) | .................................... | .................. | xi) | .................................... | .................. |
| ii) | .................................... | .................. | xii) | .................................... | .................. |
| iii) | .................................... | .................. | xiii) | .................................... | .................. |
| iv) | .................................... | .................. | xiv) | .................................... | .................. |
| v) | .................................... | .................. | xv) | .................................... | .................. |
| vi) | .................................... | .................. | xvi) | .................................... | .................. |
| vii) | .................................... | .................. | xvii) | .................................... | .................. |
| viii) | .................................... | .................. | xviii) | .................................... | .................. |
| ix) | .................................... | .................. | xix) | .................................... | .................. |
| x) | .................................... | .................. | xx) | .................................... | .................. |

සැ.යු.:- පෞද්ගලික ලිපිගොනුව හා සහතික පත්‍රයට අවශ්‍ය ලෙස නම් සඳහන් විය යුතුය.

04. සේවා ස්ථානය පිළිබඳ සහතිකය :

උක්ත නම / නම් සඳහන් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව / ක්‍රීඩකයන් / ක්‍රීඩිකාවන් (අනවශ්‍ය වචන කපා හරින්න) ..........................................................................(ආයතනයේ නම) ට අනුයුක්තව සේවය කරනු ලබන රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ වැටුප් ලබන රාජ්‍ය නිලධාරියෙකු / නිලධාරිනියක / නිලධාරීන් / නිලධාරිනියන් බව සහතික කරමි.

......................................

ජේ.ස.ලේ./ස.ලේ/අධ්‍යක්ෂ/      නිල මුද්‍රාව :

පරි.නි./ආසන්නතම මාණ්ඩලික නිලධාරී

05. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

උක්ත නම / නම් සඳහන් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව / ක්‍රීඩකයන්/ ක්‍රීඩිකාවන් ..........................................
(ආයතනයේ නම ) ට අනුයුක්තව සේවය කරන රාජ්‍ය නිලධාරීන් බවත්. කිසියම් වැරදි සහගත තොරතුරක් හෝ අප ආයතනයේ සේවය කරනු නොලබන හා "ආණ්ඩුකාරවර කුසලානය" තරගාවලියේ තරග නීති රීති යටතේ අප ආයතනයට ක්‍රීඩා කළ නොහැකි යම් අයෙකුගේ නමක් හෝ ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ තරග සඳහා තරග වැදුණු අයෙකුගේ නමක් මෙහි ඇතුලත්ව නොමැති බවත් තහවුරු කරමි. ආණ්ඩුකාරවර කුසලානයේ තරග ඉසව් නීති රීති දැනුමවත් බවත්, එම නීති රීති වලට යටත්ව තරග වැදීමට එකඟ බවත් දැනුම් දෙමි.

.....................................

ආයතන ප්‍රධානි:

(නිල මුද්‍රාව)

දිනය :

---

කාර්‍යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

සභාපති,

ප්‍රධාන මෙහෙයුම් කමිටුව,

ආණ්ඩුකාරවර කුසලානය - 2024.

උක්ත ආයතනයේ සහතික කරන ලද ක්‍රීඩක / ක්‍රීඩිකාවන් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය - 2024 සඳහා ඇතුළත් කර ගැනීම අනුමතයි.

.....................................

ප්‍රධාන ලේකම්

බස්නාහිර පළාත් සභාව